**ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා**

**6 ශ්‍රේණිය**

**මධ්‍ය වාර පරීක්ෂණය - 2023**

කාලයඃ පැය 02

නම/ විභාග අංකයඃ...........................................................................................................................

**අංක 1 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. කුරු ශාක විශේෂයකි.

(1) ගඳපාන (2) බෝගන්විලා (3) පෙපරෝමියා (4) ඩ්‍රැසීනා

2. ජීව වසුනකි.

(1) කඩදාසි (2) ගොටුකොළ (3) පොලිතින් (4) පොල්ලෙලි

3. ශාක පරාගනය කරයි.

(1) ඇටිකුකුළා (2) කපුටා (3) මී මැස්සා (4) ගැඩවිලා

4. ආහාර පිරමීඩයේ ඉහළින් ම ඇත්තේ

(1) පලතුරු (2) පළා වර්ග හා එළවළු

(3) ධාන්‍ය හා අල වර්ග (4) තෙල් හා සීනි

5. මාෂ බෝගයකි.

(1) මස් (2) මුංඇට (3) තිරිඟු (4) හාල්

6. සැකසූ ආහාර වලින් ලැබෙන වාසියක් නොවන්නේ,

(1) ආහාර වල විවිධත්වයක් ඇතිවීම.

(2) රැගෙන යාම පහසුයි.

(3) ගබඩා කිරීම පහසුයි.

(4) පෝෂ්‍ය පදාර්ථ සම්පූර්ණයෙන් ම අඩංගු නොවීම.

7. භාණ්ඩ තැනීම සඳහා අවශ්‍ය වන අත් ආවුදයකි.

(1) අත් කියත (2) අතකොලුව (3) හැන්ද (4) වානේ කෝදුව

8. බුරුමය මගින් ඉටු කරන කාර්යය වනුයේ,

(1) ලෝහ පීරි ගෑම (2) ලී විදීම

(3) ලී මට්ටම් කිරීම (4) ඇණ ගැසීම හා ගැලවීම

9. වෙළඳපොලේ ඇති ක්ෂණික ආහාරයකට නිදසුනකි.

(1) කඩල (2) සහල් (3) බනිස් (4) දෙල්

10. ක්‍රමවත් මුළුතැන්ගෙයක වාසියක් වන්නේ,

(1) කාලය වැයවීම (2) වැඩ කිරීමේ පහසුව ඇතිවීම

(3) ගෘහණිය කාර්යබහුල වීම (4) නිවැසියන්ගේ සෞඛ්‍ය ආරක්ෂා නොවීම

11. ආහාර ගබඩා කිරීමේ ඒකකය තුළ තිබිය යුතු උපකරණයකි

(1) කපන ලෑල්ල (2) සේදුම් බක්කිය

(3) ශීතකරණය (4) වළං

12. මුළුතැන්ගෙයි ආකෘති වර්ගයකට නිදසුනක් නොවන්නේ,

(1) L හැඩයේ මුළුතැන්ගෙය

(2) U හැඩයේ මුළුතැන්ගෙය

(3) W හැඩයේ මුළුතැන්ගෙය

(4) I හැඩයේ මුළුතැන්ගෙය

13. ලෝහ පීරි ගෑම සඳහා යොදා ගන්නා අත් ආවුදයකි.

(1) පීර (2) යතුකැටය (3) කියත (4) තහඩු කතුර

14. උස් පාත්තියක රාමුවට යොදාගත නොහැකි ද්‍රව්‍යයක් වන්නේ,

(1) පිටපලු ලෑලි (2) දිරූ කොළ රොඩු

(3) පොල්ලෙලි (4) ඉවත දමන ගොඩනැගිලි ද්‍රව්‍ය

15. භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගන්නා ලෝහ සතු ගුණාංගයක් නොවන්නේ,

(1) තාපය රඳවා ගැනීමේ හැකියාව (2) ඔරොත්තු දීමේ හැකියාව අඩු වීම

(3) විදුලිය ගමන් කිරීමේ හැකියාව (4) නැමීමේ හැකියාව

**ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා වගුගත කරන්න.**

| ජීවත් වන ස්ථානය | ජීවියා |
|---|---|
| 16. පස තුල | ........................................................ |
| 17. ලී කොට මත | ........................................................ |
| 18. මිරිදිය පොකුණු තුළ | ........................................................ |
| 19. උස ශාක වල | ........................................................ |
| 20. මිටි ශාක වල | ........................................................ |

**( කෑරලා, ගැඩවිලා, තිත්තයා, දෙමලිච්චා, බස්සා )**

## II කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01.

(i) ගෙවත්තේ ශාක වගා කිරීමෙන් ඇති ප්‍රයෝජන 04 ක් ලියන්න. ල.04

(ii) දඬු කැබලි මගින් පැළ කරගත හැකි බෝග වර්ග 02 ක් හා බීජ මගින් පැළ බෝ කරගත හැකි බෝග වර්ග 2ක් නම් කරන්න. ල.04

(iii) රාමුවක් සහිත උස් පාත්තියක වගා කිරීමෙන් අපට ලැබෙන වාසි 04 ක් ලියන්න.

ල.04

(iv) වගා මිතුරු සතුන් දෙදෙනෙකු හා වගා මිතුරු ශාක දෙකක් නම් කරන්න. ල.04

(v) වසුන් විවිධාකාරයට වර්ග කළ හැකිය. ඉන් එක් ආකාරයක් දක්වා ඒ සඳහා නිදසුන් 01 බැගින් ලියන්න. ල.04

02.

(i) විසිතුරු පත්‍රික ශාක වර්ග 03 ක් නම් කරන්න. ල.03

(ii) අලංකාර මල් සහිත ශාක වර්ග 03 ක් නම් කරන්න. ල.03

(iii) සිටුවා ගත් පැළයක් නැවත බඳුන්ගත කිරීමට සිදුවන අවස්ථා 02 ක් නම් කරන්න.

ල.02

(iv) ගෙවතු වල දක්නට ලැබෙන සතුන් 02නෙකු නම් කරන්න. ල.02

03.

(i) ගෙවතු හා පාසල් පරිසරයට ජීවීන්ගෙන් ඇති ප්‍රයෝජන 03ක් ලියන්න. ල.03

(ii) ගෙවත්තට විවිධ ජීවීන් ආකර්ෂණය කර ගැනීමට ඔබ යොදා ගන්නා විවිධ උපක්‍රම 02ක් නම් කරන්න. ල.02

(iii) ආහාර කල්තබා ගැනීමට පැරැන්නන් යෙදූ ක්‍රම 03ක් ලියන්න. ල.03

(iv) නැවුම් ආහාරයක් සතු ගුණාත්මක ලක්ෂණ 02ක් නම් කරන්න. ල.02

04.

(i) ආහාර සඳහා භාවිතා කරන ලේබලයක අඩංගු කරුණු 04ක් නම් කරන්න. ල.04

(ii) ක්‍රමවත් මුළුතැන්ගෙයක ලක්ෂණ 03 ක් නම් කරන්න. ල.03

(iii) මුළුතැන්ගෙයක වැඩ ත්‍රිකෝණය පිළිවෙලින් නම් කරන්න. ල.03

05.

(i) ආහාර නරක් වීමට බලපාන ප්‍රධාන හේතු 03 ක් නම් කරන්න. ල.03

(ii) මුළුතැන්ගෙයි සැලසුමක් ඇඳීමේදී භාවිතා කරන පහත සංකේත ඇඳ දක්වන්න.

a) මුළුතැන්ගෙයි ජනේලය
b) ආහාර පිසීමේ ඒකකය
c) ආහාර ගබඩා කිරීමේ ඒකකය
d) මුළුතැන්ගෙයි බිත්ති ල.04

(iii) වැඩකරන පුද්ගලයින්ගේ ආරක්ෂාව සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 03ක් නම් කරන්න. ල.03

## පිළිතුරු
## I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | (1) | 02. | (2) | 03. | (3) |
| 04. | (4) | 05. | (2) | 06. | (4) |
| 07. | (1) | 08. | (2) | 09. | (3) |
| 10. | (2) | 11. | (3) | 12. | (3) |
| 13. | (1) | 14. | (2) | 15. | (2) |
| 16. | ගැඩවිලා | 17. | කෑරලා | 18. | තිත්තයා |
| 19. | බස්සා | 20. | දෙමලිච්චා | | |

## II කොටස

01.

(i) ආර්ථික වාසි ලබාගත හැකි වීම
පිරිසිදු වාතාශ්‍රය ලබාගත හැකි වීම
නැවුම් පිරිසිදු ආහාර බෝග ලබාගත හැකි වීම
බෝග වගා කිරීමේ හැකියාව වර්ධනය වීම
තුරුලතා ගැවසීගත් සුන්දර පරිසරයක් නිර්මාණය කළ හැකි වීම

(ii) දඬු මගින් - නිවිති, මඤ්ඤොක්කා, කංකුං, ගම්මිරිස්
බීජ මගින් - බණ්ඩක්කා, රාබු, මෑ, තක්කාලි

(iii) රෝපණ ද්‍රව්‍ය අපතේ නොයාම
නිසි පරිදි නඩත්තු කිරීමේ පහසුව
වල් පැළෑටි පහසුවෙන් අතින් උදුරා දැමිය හැකිවීම
අඩු ජල ප්‍රමාණයක් ප්‍රමාණවත් වීම
පාත්තියේ පස සෝදා යාම වලක්වා ගත හැකි වීම
අවශ්‍යතාව අනුව පාත්තියේ ප්‍රමාණය වෙනස් කළ හැකි වීම

(iv) වගා මිතුරු සතුන් - ගැඩවිලා, බිංඋරා, ඇටිකුකුළා, කටුස්සා, බත්කූරා, ගෙම්බා, මල් කුරුමිණියා, ඉබිකුරුමිණියා
වගා මිතුරු ශාක - මිරිස්, සුදුළූණු, ඉඟුරු, කැනාස්, මින්චි, ගඳපාන, ලීක්ස්, කැරට්, කොත්තමල්ලි, දෙහි

(v) ජීව වසුන් හා අජීව වසුන්
ජීව වසුන් - ගොටුකොල, බතල, රටකජු
අජීව වසුන් - පොල්කුඩු, ලී කුඩු, පදුරු, පොල් අතු, කෙසෙල් පත්‍ර, කොහුබත්, දහයියා

දිරාපත් වන හා දිරාපත් නොවන වසුන්
දිරාපත් වන - කඩදාසි
දිරාපත් නොවන - පොලිතින්

02.

(i) කෝලියාස්, මීවන, මොන්ස්ටෙරා, බිගෝනියා, එපිෂියා, සෙන්සවේරියා, බිගෝනියා, ඩ්‍රැසීනා, කැලේතියා, දුරන්තා, පාම්, ක්‍රෝටන්
(ii) සීනියාස්, රෝස, ඩේලියා, කූඩලු, කපුරු, වැල්රෝස, කැනාස්, ද්‍රාස්පෙතියා
(iii) පොහොර යෙදුවද පැළෑටියේ වර්ධනයේ වෙනසක් දක්නට නොලැබෙන අවස්ථා
පැළෑටියේ මුල් බඳුනෙන් පිටතට පැමිණි අවස්ථා
පැළය විශාල වීම නිසා එම බඳුන තවදුරටත් ප්‍රමාණවත් නොවන අවස්ථා

(iv) ඇටිකුකුළා, උරු මීයා, හාවා, උණහපුලුවා, කබරගොයා, දඬුලේනා, මුගටියා, ඉත්තෑවා, වවුලා, කලවැද්දා, පූසා, බල්ලා

03.

(i) ශාක පරාගනය
බීජ හා ඵල ව්‍යාප්ත කිරීම
කොම්පොස්ට් පොහොර සකස් කිරීම
පස බුරුල් කිරීම
පරිසර අලංකරණය
වගාවට හානි පමුණුවන ජීවීන් පාලනය කිරීම

(ii) කුරුළු නාන තටාක සකස් කිරීම
ආහාර බඳුන් සකස් කිරීම
බාලොලියා මල් වැවීම
ගෙවත්තේ සුදුසු ස්ථාන වල මී මැසි ගෝචර ශාක සිටුවීම
බිඳුන වලං, කල, මැටි බඳුන් යටි අතට හරවා තැබීමෙන් ගෙම්බන් ගෙන්වා ගත හැකිය

(iii) වියළීම
මී පැණි වල බහා තැබීම
දුම් ගැස්සීම
බඩඉරිඟු කරල් වැනි දෑ පිටත ආවරණය සමග දුමේ එල්ලා තැබීම
වැලි තුල යට කිරීම

(iv) ස්වාභාවික වර්ණය ආරක්ෂා වී තිබීම
පෝෂණ ගුණය ආරක්ෂා වී තිබීම
ආවේණික පෙනුම ආරක්ෂා වී තිබීම
ආවේණික සුවඳ තිබීම
සෞඛ්‍යාරක්ෂිත බවින් යුක්ත වීම

04.

(i) ආහාරයේ නම / මිල
අඩංගු බර / අඩංගු ද්‍රව්‍ය
නිෂ්පාදිත දිනය / පෝෂක තොරතුරු
කල්ඉකුත්වීමේ දිනය / විවිධ ප්‍රමිති සහතික

(ii) කාමරයේ ඉඩකඩ අනුව ඒකක වෙන් කිරීම
ඒකක වමේ සිට දකුණට ස්ථානගත කිරීම
වාතාශ්‍රය හා ආලෝකය හොඳින් ලැබීම
ක්‍රමවත් ජල සැපයුමක් හා විදුලි සැපයුමක් තිබීම
උපකරණ හා ආම්පන්න පවිත්‍රව තිබීම
ජනේලය අසල සේදීමේ ඒකකය ස්ථානගත කිරීම


(iii) ආහාර ගබඩා කිරීමේ ඒකකය
ආහාර පිසීමට පෙර සකස් කිරීමේ ඒකකය
ආහාර පිසීමේ ඒකකය

05.


(i) භෞතික හේතු / ජීව විද්‍යාත්මක හේතු / රසායනික හේතු

(ii) a)



b)


c)


d)


(iii) භාවිත කරන අත් ආවුද හා උපකරණ පිළිබඳ නිවැරදි අවබෝධය
ආවුද හා උපකරණ භාවිතය පිළිබඳ නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කිරීම
ආරක්ෂිත උපකරණ පැළඳ සිටීම / කාර්යයට උචිත ඇඳුම් ඇඳ සිටීම